# 10 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

## 09 පාඩම


**සැකසුම හා ඉදිරිපත් කිරීම**

ඒ. වී. චමින්ද විජේකුමාර ආරියදාස මයා

කෑ/ දෙහි/ සීපෝත් සේනානායක ක. වි.

**අධීක්ෂණය**

බී.ඒ.අයි.අයි.සංජු ලෝචන මයා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල හා ආගම)

දෙහිඕවිට අධ්‍යාපන කලාපය

chamindavijeekumara@gmail.com

දු.ක. අංකය :- 0718416477, 0702035765

# 09 පාඩම

# සබඳතා රකින මිනිස් යුතුකම්



# සබඳතා රකින මිනිස් යුතුකම්

## සිඟාලෝවාද සූත්‍රය

- ✓නිවැරදි දිසා නමස්කාරය පැහැදිලි කරමින් බුදුන් වහන්සේ විසින් සිඟාල නම් තරුණයාට දේශනා කරන ලද්දකි.
- ✓සමාජයක යහපැවැත්ම සඳහා ඒ ඒ සමාජ කොටස් අතර ඉටු විය යුතු යුතුකම් සවිස්තරව සිඟාලෝවාද සූත්‍රයේදී දේශනා කර ඇත.

# සිඟාලෝවාද සූත්‍රයට අනුව සමාජය සදිසාවන්ට බෙදී ඇති ආකාරය

උතුරු දිශාව
හිත මිතුරන්

උඩ දිශාව
පැවිදි උතුමන්

බටහිර දිශාව
අඹු දරුවන්

නැගෙනහිර දිශාව
මවුපියන්

දකුණු දිශාව
ගුරුවරුන්

යට දිශාව
සේවක සේවිකාවන්


# මව්පිය - දූ දරු සබඳතාව

සමාජයේ දක්නට ලැබෙන ප්‍රධාන සමාජ කණ්ඩායම් දෙකක් ලෙස දෙමාපියන් හා දරුවන් දැක්විය හැකිය. දෙමාපියන් හා දරුවන් අතර යහපත් සබඳතාවක් පවත්වා ගැනීම දෙපක්ෂයේ ම යහපතට හේතු වේ. මවුපියන් පූර්ව දිශාවට (නැගෙනහිර) උපමාකොට දක්වා ඇත්තේ දරුවෙකු මවුකුස පිළිසිඳ ගත් දිනයේ පටන් ඇති දැඩි කරනු ලබන්නේ දෙමාපියන් නිසාවෙනි. දරුවන් පාසල් අධ්‍යාපනය ලැබීමට පෙර දැනගතයුතු බොහෝ දේ උගන්වනු ලබන්නේ දෙමාපියන් නිසාවෙන් පුබ්බාචරිය(මුල්ගුරුවරු) වශයෙන් හඳුන්වයි. මහා බ්‍රහ්මයා තුළ පවතිනවා යැයි සැලකෙන මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණ දෙමාපියන් දරුවන් කෙරෙහි දක්වන බැවින් බ්‍රහ්ම, පුබ්බදේව යන විශේෂ වචන වලින් දෙමාපියන් හඳුන්වයි.

# මව්පිය - දූ දරු සබඳතාව

## දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටුවිය යුතු යුතුකම්

- මවුපියන් පෝෂණය කිරීම
- ඔවුන්ගේ කටයුතු සොයා බලා ඉටු කර දීම
- දෙමාපිටන් රැකගෙන ආ කුල පරපුර හා ඊට සම්බන්ධ සිරිත් විරිත් ආරක්ෂා කිරීම
- දෙමාපියන්ගෙන් හිමි වූ දේ රැක ගැනීම
- මවුපියන් පරලොව ගිය පසු පින් අනුමෝදන් කර වීම



# මව්පිය - දූ දරු සබඳතාව

## දෙමාපියන්ගෙන් දරුවන්ට ඉටුවිය යුතු යුතුකම්

- දරුවන් වරදින් මුදවා ගැනීම
- ඔවුන් යහපත් කටයුතුවල යෙදවීම
- ඉගෙනීමේ කටයුතුවල යෙදවීම
- ගැළපෙන අවාහ විවාහ කර දීම
- සුදුසු කල්හි සම්පත් පවරා දීම



# ගුරු - සිසු සබඳතාව

සමාජයේ දක්නට ඇති තවත් ප්‍රධාන සමාජ කණ්ඩායම් දෙකක් ලෙස ගුරුවරුන් හා ශිෂ්‍යයන් දැක්විය හැකිය. ඔවුන් අතර යහපත් සබඳතාවක් ගොඩනගා ගැනීමට අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් කිරීම ඉතා වැදගත්ය. ශිෂ්‍යයෙකුට දෙමාපියන් හැරුණුවිට යහපත් පුරවැසියෙකු ලෙස සමාජයේ ජීවත් වීමට අවශ්‍ය ගුණ ධර්ම හා චරිත ශක්තිය ඇති කරනු ලබන්නේ ගුරුවරයා යි. එබැවින් ශිෂ්‍යයන්ගේ දක්ෂිණාවට වෙත් ගෞරවය ලැබීමට සුදුසු පිරිසක් බැවින් ගුරුවරයා දකුණු දිශාවට උපමා කර ඇත.

# ගුරු - සිසු සබඳතාව

**ශිෂ්‍යකු විසින් ගුරුවරුන්ට ඉටුකළ යුතු යුතුකම්**

- ✓ දුටු විට හුනස්නෙන් නැගිටීම
- ✓ අවශ්‍ය උපස්ථාන කිරීම
- ✓ අවවාද අනුශාසනාවලට මැනැවින් ඇහුම්කන් දීම
- ✓ අවශ්‍ය කටයුතු ඉටු කර දීම
- ✓ මැනැවින් ඉගෙන ගැනීම



# ගුරු - සිසු සබඳතාව

## ගුරුවරයා විසින් ශිෂ්‍යයින්ට ඉටුකළ යුතු යුතුකම්

- ✓මැනවින් හික්මවීම
- ✓මැනවින් ඉගැන්වීම
- ✓දන්නා සියලු ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීම
- ✓තම මිත්‍රයන්ට හඳුන්වා දීම
- ✓ශිෂ්‍යයා ආරක්ෂා කර ගැනීම



# අඹු - සැමි සබඳතාව

සමාජයේ වැදගත්ම ඒකකයක් වන පවුලේ ප්‍රධානම සාමාජිකයන් වන්නේ බිරිය සහ සැමියා යි. පවුලේ සාමයත්, සතුටත්, දියුණුවත්. දූ දරුවන්ගේ යහපතත් සැලසෙන්නේ බිරිඳත් සැමියාත් අතර ඇති සම්බන්ධය මතය. බුදුරදුන් බටහිර දිශාවට අඹුසැමියන්දක්වා ඇත. දෙවියෙකු හා දෙවඟණක මෙන් අඹුසැමියන් ජීවත්වනු දැකීම බුදු සමයේ අපේක්ෂාව යි.

# අඹු - සැමි සබඳතාව

**සැමියා විසින් බිරිඳට ඉටුකළ යුතු යුතුකම්**

- ගරු කිරීම
- අවමන් නොකිරීම
- පරදාර සේවනයේ නොයෙදීම
- ගෙදර වගකීම් පැවරීම
- ඇඳුම් පැලඳුම් සපයා දීම



# අඹු - සැමි සබඳතාව

## බිරිඳ විසින් සැමියාට ඉටුකළ යුතු යුතුකම්

- ❖ගෙදර කටයුතු මැනැවින් සංවිධානය කිරීම
- ❖ඇසුරු කරන පිරිසට මැනැවින් සංග්‍රහ කිරීම
- ❖පර පුරුෂ සේවනය නොකිරීම
- ❖උපයන ලද ධනය ආරක්ෂා කිරීම
- ❖සෑම කටයුතුතක දී ම දක්ෂ වීම හා අනලස් වීම



# යහළු - මිත්‍ර සබඳතාව

පෞද්ගලික කටයුතුවලදී මෙන්ම පොදු කටයුතු වලදී ද මිතුයින්ගේ සහාය අපට අවශ්‍යය. මිතුයන් දෙයාකාරය. යහපත් මිත්‍රයෝ හා ව්‍යාජ මිත්‍රයෝ වශයෙනි. යහපත් මිත්‍රයන් කල්‍යාණ මිත්‍රයන් ලෙසත් ව්‍යාජ මිත්‍රයන් මිත්‍ර ප්‍රතිරූපකයන් ලෙත් බුදුරදු දක්වා ඇත. කල්‍යාණ මිත්‍රයන් ඇසුරත් මිත්‍ර ප්‍රතිරූපකයන්ගෙන් ඈත් වීමත් මෙලොව පරලොව යහපතට හේතු වේ. යහපත් මිත්‍රයන් උතුරු දිශාවට දක්වා ඇත්තේ උවදුරු වලින් එතෙර කරනවාය යන අර්ථයෙනි.

# යහළු - මිත්‍ර සබඳතාව

## කුල පුත්‍රයන් විසින් මිතුරන්ට ඉටුකළ යුතු යුතුකම්

- මිතුරාට අවශ්‍ය දේ දීම
- ප්‍රිය වචනයෙන් කථා කිරීම
- දියුණුව සඳහා කටයුතු කිරීම
- සමානාත්මතාව දැක්වීම
- නොරැවටීම



# යහළු - මිත්‍ර සබඳතාව

**මිතුරන් විසින් කුල පුත්‍රයාට ඉටුකළ යුතු යුතුකම්**

- දුසිරිතෙහි වැටී ප්‍රමාද වූ මිතුරා ආරක්ෂා කර ගැනීම
- එබඳු මිතුරාගේ වස්තුව ආරක්ෂා කර දීම
- බියට පත් මිතුරා ඉන් මුදා ගැනීම
- විපතට පත් මිතුරා අත් නොහැරීම
- මිතුරාගේ අඹුදරුවන්ට සැලකීම



# සේවාය - සේවක සබඳතාව

සේවාය - සේවක සම්බන්ධ පවත්වා ගැනීමේ ප්‍රධාන වගකීම පවරා ඇත්තේ සේවාය පක්ෂයට ය. සේවක පක්ෂය යට දිශාවට දක්වා ඇත්තේ කර්මාන්ත, ව්‍යාපාර ආදියෙහි දියුණුව, පැවැත්ම රඳා පවතින්නේ සේවකයන්ගේ ශක්තිය මත නිසාවෙනි. සේවකයින් තෘප්තිමත් වන අයුරින් ක්‍රියා කිරීම සේවායයන්ගේ(හාම්පුතුන්ගේ) යුතුකම බව බුදුරදුන් පෙන්වා දි ඇත.

# සේවා - සේවක සබඳතාව

සේවායයා විසින් සේවකයාට ඉටුකළ යුතු යුතුකම්

- සේවකයාගේ ශක්ති ප්‍රමාණයට වැඩ පැවරීම
- සුදුසු පරිදි ආහාර හා වැටුප් ලබා දීම
- සෞඛ්‍ය පහසුකම් සපයා දීම
- මිහිරි ආහාරපාන ආදිය නිසි ලෙස බෙදා දීම
- සුදුසු අවස්ථාවන්හි විවේක දීම



# සේවා‍ය - සේවක සබඳතාව

## සේවකයා විසින් සේවායයාට ඉටුකළ යුතු යුතුකම්

- ස්වාමියාට පළමු ව පිබිදීම
- ස්වාමියාට පසු ව නිදා ගැනීම
- ස්වාමියා දුන් දේ පමණක් ගැනිම
- වැඩ කටයුතු ඉතා හොඳින් කිරීම
- ස්වාමියාගේ ගුණ වර්ණනා කිරීම

# ගිහි - පැවිදි සබඳතාව

දැහැමි සමාජයක පදනම වන්නේ ගිහි - පැවිදි සබඳතාව මතය. බුදු සසුනේ ගිහි පිරිස උපාසක, උපාසිකා ලෙස ද පැවිදි පිරිස භික්ෂු - භික්ෂුණී ලෙසත් හඳුන්වයි. මිනිස් වර්ගයා උතුම් තත්වයට පත් කිරීමට දහම් මඟ පෙන්වා දෙන හෙයින් පැවිදි පිරිස උඩ දිශාවට දක්වා ඇත. ගිහි පිරිස ආමිසයෙන් පැවිදි උතුමන්ට සංග්‍රහ කරන විට පැවිදි උතුමන් ගිහියාට ධර්ම දානයෙන් සංග්‍රහ කළ යුතුය.

# ගිහි - පැවිදි සබඳතාව

**ගිහියන් විසින් පැවිදි උතුමන්ට ඉටුකළ යුතු යුතුකම්**

- මෛත්‍රී සහගත ව ක්‍රියා කිරීම
- මෛත්‍රී සහගත ව කථා කිරීම
- මෛත්‍රී සහගත සිත් පහළ කර ගැනීම
- නිවසට පැමිණි විට සතුටින් පිළිගැනීම
- ආමිසයෙන් සංග්‍රහ කිරීම



# ගිහි - පැවිදි සබඳතාව

**පැවිදි උතුමන් විසින් ගිහියන්ට ඉටුකළ යුතු යුතුකම්**

- පවින් වැළැක්වීම
- යහපත් ක්‍රියා වල යෙදවීම
- හොඳ හිතින් ම අනුකම්පා කිරීම
- නො ඇසූ දේ කියා දීම
- ඇසූ දේ පැහැදිලි කර දීම
- සුගතියට සග පෙන්වීම



# සදිසා නමස්කාරය සමස්ත සමාජයේ ම දියුණුවට පිටිවහලක් වන ආකාරය

- ✓ සමාජ කණ්ඩායම් අතර අන්‍යොන්‍ය විශ්වාසය හා බැඳීම් ඇති වේ.
- ✓ හුදෙකලා බව පහව යයි.
- ✓ මිත්‍රත්වය ගොඩනැගේ.
- ✓ දුක - සැප බෙදා හදාගෙන ජීවත් වෙයි.
- ✓ අන්‍යොන්‍ය විරසක වීම්, ගැටුම්, බිඳ වැටීම් සමාජයෙන් තුරන් වේ.
- ✓ සාමය සමගිය තහවුරු වේ.
- ✓ ලෝකයේ අභිවෘද්ධියට හා සැපවත් බවට හේතු වේ.

# පුහුණුවට

මාතා පිතා දිසා පුබ්බා
ආචාරියා දක්ඛිනා දිසා
පුත්තදාරා දිසා පච්ඡා
මිත්තාමච්චා ච උත්තරාද

දාස කම්මරා හෙට්ඨා
උද්ධං සමණ බ්‍රාහ්මණා
ඒතා දිසා නමස්සෙය්‍ය
අලමත්ථෝ කුලේ ගිහි

(සිඟාලෝවාද සූත්‍රය)

# තෙරුවන් සරණයි..!